කාන්තා බාහිර රූපය ඉස්මතු නොකරමු, කාන්තාවන් ලිංගික වස්තූන් ලෙසින් හුවා නොදක්වමු!

පුවත් වාර්තාකරණය සඳහා දේශීයව සහ ජාත්‍යන්තරව හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්මයන් හා මාධ්‍ය මාර්ගෝපදේශයන්, කතුවැකි සඳහා ද එලෙසින්ම අදාළ වන බව කිව හැක.

එනම් පුවතකට අදාළ නොවන කාන්තා බාහිර රූපය ඉස්මතු කොට දැක්වීම සහ ඒ ඔස්සේ පුවතකට අනවශ්‍ය හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබාදීම වැනි භාවිතයන් සම්බන්ධයෙන් පවා කතුවැකියක් රචනා කරනා පුවත් කර්තෘවරයෙකු සැලකිලිමත් විය යුතු නොවේදැයි මෙහිදී පාඨකයින් ලෙසට අප ඇසිය යුතු වේ.

"මත්ද්‍රව්‍ය බෝම්බය" යන සිරස්තලයෙන් යුතුව දිවයින කතුවැකියක් (පෙබරවාරි 20, 2024) ලියැවී තිබුණු අතර, එහි පහත ආකාරයේ සඳහන් කිරීම් ද දක්නට ලැබිණි.

* "බොරැල්ලෙන් අල්ලාගත් කුඩුකාරයන් අතර, කොණ්ඩේ ටින්ඩ් කළ සුදුම සුදු සහ ලස්සන ලස්සන තරුණියක් ද සිටියාය. ඇය කුඩු ග්‍රෑම් දහතුනයි දශම ගණනක් සිය රහස් ප්‍රදේශයේ සඟවා ගෙන සිටි බවද හෙළි විය."

ඔබ සිතන ලෙසට,

1) මෙම කතුවැකිය තුළ අදාළ සැකකාරියක " කුඩු ග්‍රෑම් දහතුනයි දශම ගණනක් සිය රහස් ප්‍රදේශයේ සඟවා ගෙන සිටි බවද හෙළි වූ" බව පවසන අතරම, ඇය "කොණ්ඩේ ටින්ඩ් කළ සුදුම සුදු සහ ලස්සන ලස්සන තරුණියක්" බවද සඳහන් කරන්නේ මෙම පුවතට අනවශ්‍ය හැඟීම් කළඹවන සුළු වර්ණයක් ලබා දීමට නොවේද?

2) එම සැකකාරියගේ බාහිර රූපය එම සිදුවීමට අදාළ වන්නේ ද? එසේ අදාළ නොවේ නම්, මෙසේ සැකකාරියගේ බාහිර රූපය ඉස්මතු කර සඳහන් කිරීම, කාන්තාව ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය කිරීමක් නොවේද?

එසේ නම් මෙම කතුවැකිය කෙතරම් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගත වන්නේ ද?

